# වසංගතයේ
# අඳුරු පැතිකඩ

## වසංගතය අතරතුර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ලොබි ලේඛනය



Kingdom of the Netherlands

Centre for Equality and Justice

# වසංගතයේ අඳුරු පැතිකඩ

## වසංගතය අතරතුර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම පිළිබඳ ලොබි ලේඛනය

**නොවැම්බර් 2022**

මෙම ලොබි ලේඛනය මගින් ශ්‍රී ලංකාව තුල කොවිඩ් 19 වසංගතය, අනෙකුත් හදිසි අවස්ථා සහ ජාතික අර්බුද තත්වයන් තුලින් නිර්මාණය වූ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වූ ප්‍රතිචාරයක් දැක්වීමේ අවශ්‍යතාවය නිරූපණය කරයි. මෙම අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා, වෙනස් වූ, එහෙත් අන්තර් සම්බන්ධිත ක්ෂේත්‍රවල සම්පත් දායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා මාලාවක් පවත්වන ලද අතර ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ යෝජනා කිරීම සඳහා අධ්‍යයනයක් ද සිදු කරන ලදී. මෙම ලේඛනයේ පහත කොටස් මගින් අධ්‍යයනය සිදු කරන ලද තත්වයන් හඳුන්වා දීම, ප්‍රචණ්ඩත්වය ඇති කල සාධක සහ පද්ධතියේ හඳුනාගත් අඩුපාඩු ඇතුළු සමස්ත සොයාගැනීම්වල සැණ රුවක් සැපයීම සහ යෝජිත නිර්දේශ ගෙනහැර දැක්වීම සිදු කරයි.

# හැඳින්වීම

කොවිඩ් 19 වසංගතය ජාතික ආර්ථිකය සහ මහජන සෞඛ්‍ය ඇතුළු නූතන ජීවිතයේ සෑම අංශයකටම පාහේ බලපානු ලබන අභියෝග මාලාවක් නිර්මාණය කර ඇත. කෙසේ වෙතත්, මෙම අඛණ්ඩ අර්බුදය හමුවේ කාන්තා කේන්ද්‍රීය ගැටළු කෙරෙහි වසංගතයේ බලපෑම පිළිබඳ යොමු වී ඇත්තේ ඉතා අඩු අවධානයකි. කෙසේ වෙතත්, ගෝලීය සංඛ්‍යාලේඛන මගින් වසංගතය අතරතුර ලොව පුරා වාර්තා වන ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් සංඛ්‍යාවේ වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය (ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ සීමාව තුළට ඇතුලත් වන) "මානව හිමිකම්" හා බැඳුනු අවධානය යොමු විය යුතු කාරණයක් බවට පත්ව ඇත[1] 2020 වසරේ මාර්තු මාසයේ සිට, ශ්‍රී ලංකාව තුළ වාර්තා වී ඇති ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් සංඛ්‍යාවේ ද වැඩි වීමක් දක්නට ලැබේ. මෙම ගැටළුව සම්බන්ධයෙන් පුළුල් සමීක්ෂණ සහ පර්යේෂණ සිදු කර නොතිබුණද, උපකල්පනාත්මක සාක්ෂි මෙම නිගමනයට ප්‍රමාණවත් ලෙස සහාය වී ඇත.

මෙම ලොබි ලේඛනය කෙටුම්පත් කිරීමේදී, එහි ලේඛකයන් වසංගත තත්වය තුළ කාන්තාවන් සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් සඳහා පූර්ණ ක්‍රියාකාරී උපකාරක සේවාවක් ක්‍රියාත්මක කල කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව ***National Committee on Women ('NCW')***[2] සහ උපකාර අවැසි කාන්තාවන් ***Women in Need ('WIN')***[3] යන ආයතන හා සම්බන්ධ විය. මෙම කාල සීමාව තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් සංඛ්‍යාව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන සාක්ෂි මෙම ආයතන දෙකම විසින් සපයන ලදී. නිදසුනක් වශයෙන්, '1938' ක්ෂණික ඇමතුම් අංකය පවත්වාගෙන ගිය ***NCW*** ආයතනය තහවුරු කළේ 2020 වර්ෂය තුළ පමණක් ගෘහස්ථ හිංසන සිදුවීම් 1215 ක් වාර්තා වී ඇති බවයි. මෙම සංඛ්‍යාව 2021 දී තවදුරටත් වැඩි වී ඇති අතර, ලැබුනු ඇමතුම් 4976 න් 3489ක්ම ගෘහස්ථ හිංසන සිදුවීම් හා සම්බන්ධ ඒවා විය. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් බොහොමයක් වාර්තා නොවී පවතින තතත්වයක් තුල, මෙම සංඛ්‍යා දත්ත රට තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන්වල සත්‍ය සංඛ්‍යාව සහ අනුපාතය පිළිඹිඹු නොකරන නමුත්, ඒවා නිසැකවම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නමැති වසංගතයේ අඳුරු පැතිකඩ නිරාවරණය කරයි.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නීති ශ්‍රී ලංකාවේ නීති රාමුව තුල දීර්ඝ කාලයක් තිස්සේ ඇතුලත්ව ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත (PDVA)[4] ද 2005 වර්ෂයේ දී බලාත්මක කර ඇත. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත මඟින් නිවස තුළ සිදු කරන හිංසනය වරදක් බවට පත් කරන අතර අතුරු ආරක්ෂණ නියෝග සහ අතිරේක නියෝග හරහා වින්දිතයින්ට සහන සඳහා අවශ්‍ය වන ප්‍රවේශය ලබා දෙයි. කෙසේ වෙතත්, බොහෝ නීතිවේදීන් විශ්වාස කරන්නේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත අසම්පූර්ණ බවත් එය ක්‍රියාත්මක කිරීම සහ එහි ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් බරපතල අඩුපාඩු පවතින බවත්ය. අතිරේකව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදීභාවයෙන් කටයුතු කරනවාට වඩා මධ්‍යස්ථභාවයෙන් යුතුව කටයුතු කරන ආකාරයක් පෙනෙන්නට තිබේ. ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවලින් ආරක්ෂා වීම සහ ඒවා වැළැක්වීම හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් කරන ලද නිරීක්ෂණ වලින් ශ්‍රී ලංකාව තුල පවත්නා යටිතල පහසුකම් වල ඇති ක්‍රියා පටිපාටිමය සහ නීතිමය අඩුපාඩු පැහැදිලිව පෙන්වා දෙයි.

[1] Kim Slote සහ Carrie Cuthbert, 'ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ ලිංගික අපයෝජනය: කාන්තා මානව හිමිකම් තොරතුරු පත්‍රිකාව' <Intimate Partner Sexual Abuse: A Human Rights Information Sheet (musc.edu)> ප්‍රවේශය 2022 අගෝස්තු 02; 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ මානව හිමිකම් (යුරෝපා කවුන්සිල ද්වාරය) <Gender-based violence and human rights (coe.int)> ප්‍රවේශය 2022 අගෝස්තු 02; 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ වර්ගය (යුරෝපා කවුන්සිල ද්වාරය) <Gender-based violence and human rights (coe.int)> ප්‍රවේශය 2022 අගෝස්තු 02.

[2] NCW යනු කාන්තා කටයුතු පිළිබඳ ජාතික යාන්ත්‍රණයේ හස්තයකි.

[3] WIN යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානයකි.

[4] 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත, (PDVA).

# 1 සොයාගැනීම්

### 1.1 ප්‍රචණ්ඩත්වය සඳහා බලපාන සාධක

කොවිඩ් 19 වසංගතය නිවෙස් තුළ හිංසනය වැඩි කිරීමට උත්ප්‍රේරකයක් වන සූක්ෂ්ම මූල හේතු නිර්මාණය කළ බව අධ්‍යයනයෙන් හෙළි විය. ඒ අනුව, වසංගතය අතරතුර සහ ඉන් පසුව ගෘහස්ථ හිංසනයට හේතු වන සාධක ලෙස පහත සඳහන් සාධක හඳුනාගෙන ඇත:



**1. ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් ආතතිය සහ ඉච්ඡාභංගත්වය වැඩි වීම**

- දීර්ඝ කරන ලද ඇඳිරි නීති කාල සීමාවන් විවිධ ආර්ථික පසුබිම් ඇති පවුල්වලට මූල්‍ය බාධා පනවන ලදි.
- විරැකියාවට සහ ආදායම් අහිමිවීමට තුඩු දෙමින් වසංගතයේ මුල් අදියරේදී බොහෝ සේවකයන් හට රැකියා අහිමි විය.
- බොහෝ පවුල්වල පුරුෂයන් විසින් මුහුණ දෙන මූල්‍යමය බාධාවන් හේතුවෙන් ඔවුන් අත්විඳින දැඩි කලකිරීම සහ කනස්සල්ල ප්‍රචණ්ඩත්ව ක්‍රියා වලට මග පාදයි.



**2. වසංගතය අතරතුර සේවා සපයන්නන් වෙත ප්‍රවේශය සීමා සහිත වීම**

- ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති සමාජ සහ විධිමත් ජාලවලට ද වසංගතය බාධා ඇති කළේය.
- සංචරණ සීමා පැනවීම හේතුවෙන් පොලිස් නිලධාරීන්, කාන්තා සංවර්ධන නිලධාරීන් සහ රැඳවුම් නිවාස ඇතුළු සේවා සපයන්නන් වෙත පවතින ප්‍රවේශය ද සීමා සහිත විය.
- මෙම කාල සීමාව තුළ අරමුදල් සම්පාදනය ද දුර්වල වීම හේතුවෙන්, රාජ්‍ය නොවන සංවිධාන විසින් සපයනු ලබන ආධාර වෙත ප්‍රවේශය ද සීමා විය.
- වසංගතයේ උච්චතම අවස්ථාව තුළ සෞඛ්‍ය අංශය වඩාත්ම ප්‍රවේශ විය හැකි සේවා සපයන්නා වූ බව ප්‍රධාන පෙළේ පුද්ගල සම්මුඛ සාකච්ඡා මගින් තහවුරු විය. කෙසේ වෙතත්, සියලු සම්පත් සහ මිනිස් බලය කොවිඩ් 19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා යොමු කරන ලද අතර, වසංගතයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ බලපෑම් පිළිබඳ අවධානය නැවත වරක් ගිලිහී ගියේය.
- තවද, වින්දිතයන් තම වේදනාවන් නිහඬව දරාගැනීමට තීරණය කිරීම නිසා ද බොහෝ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් වාර්තා වී නැත.



**3. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට උපකාර කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් නොමැති වීම**

- කාන්තා ආරක්ෂාව වැඩි දියුණු කිරීමට සහ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සඳහා පවත්නා යටිතල පහසුකම්, වසංගත තත්වය තුළ කාර්යක්ෂමව ක්‍රියාත්මක නොවීය.
- මෙතරම් විශාල පරිමාණයෙන් ගෘහස්ථ හිංසනය පිළිබඳ සිද්ධීන් හැසිරවීමට ක්ෂණික ඇමතුම් සේවා ඇතුළු විකල්ප සේවා සපයන්නන් සන්නද්ධ වී නොසිටීම.
- එබැවින්, මෙම විකල්ප ආධාරක මාධ්‍ය පිළිබඳව කාන්තාවන් දැනුවත් කළද, වසංගත තත්වය තුළ සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම/අකාර්යක්ෂමතාවය හේතුවෙන්, බොහෝ කාන්තාවන් හට උපකාර

ලබා ගැනීමට නොහැකි වූ අතර ඒ වෙනුවට ප්‍රචණ්ඩත්වය දරා ගැනීම ඔවුන් විසින් තෝරා ගන්නා ලදි.




### 4. තරඟකාරී අරමුණු

- වඩාත් සැලකිය යුතු ගැටලුව වශයෙන් වසංගතය වැඩි අවධානය දිනා ගත් අතර ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළු පසෙකට තල්ලු විය.
- එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවතින සියලු සම්පත් වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා යොදවන ලද අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳව අවධානය යොමු වූයේ අඩුවෙනි.



### 5. ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඒකාකෘතිකරණය

- පීතෘමූලික චාරිත්‍ර වාරිත්‍ර සහ විශ්වාසයන් තුළ මුල්බැසගත් පවුල් ආකෘතින් තුල පිරිමින් කාන්තාවන් කෙරෙහි ආධිපත්‍යය දරනු ලබන ආකාරයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්ප්‍රදායික අවබෝධයක් උකහා ගෙන ඇත.
- මෙම විශ්වාසයන් කලත්‍ර සබඳතාව තුළ බල අසමතුලිතතාවයක් ඇති කරන අතර, එම පවුල් න්‍යෂ්ටීන් තුළ කාන්තාවන් කෙරෙහි හිංසනය පැතිරවීමට පිරිමින්ට බලය ලබා දෙයි.
- බොහෝ අවස්ථාවලදී, මෙම මුල් බැසගත් බල අසමතුලිතතාවය තුල කාන්තාවන් විසින් අපවාදයන් දරාගනිමින් නිහඬව දුක් විඳීම අපේක්ෂා කරයි.
- බොහෝ කාන්තාවන් හිංසනය පිළිබඳ සිදුවීම් වාර්තා කිරීම තහනම්යැයි විශ්වාස කරන අතර ඒ වෙනුවට තම අපවාදාත්මක සහකරුවන් නිහඬව විඳදරාගැනීම තෝරා ගනී.




### 6. නීති විරෝධී මත්පැන් සඳහා ප්‍රවේශය

- නීති විරෝධී මත්පැන් සඳහා ඇති ප්‍රවේශය ප්‍රචණ්ඩත්වය අවුළුවාලන ප්‍රධාන සාධකයක් ලෙස හෙළි විය.
- මත්පැන් මිලදී ගැනීමේ නීත්‍යානුකූල ක්‍රම නොමැතිවීම තුල, බොහෝ පිරිමින් නීති විරෝධී මත්පැන් ලබා ගැනීමට විකල්ප මාර්ග සොයා ගනී.
- නිවෙස් තුළ මත්පැන් පානය කිරීම බොහෝ විට කාන්තාවන් වින්දිත භාවයට පත්වීමට හේතු විය.




## 1.2 දුර්වලතා



### 1. කාන්තා අධිකාරියක්/කොමිසමක් නොමැතිකම

- විධිමත් රාජ්‍ය යාන්ත්‍රණය තුල දැනට කාන්තා කටයුතු ආමන්ත්‍රණය කිරීමට ප්‍රමාණවත් නෛතික හැකියාවක් ඇති අධිකාරියක් හෝ කොමිෂන් සභාවක් නොමැත.



### 2. සේවා සපයන්නන් වෙත ප්‍රවේශය අවම වීම

- දැඩි අගුලු දැමීම් සහ ඇඳිරි නීති රෙගුලාසි මගින් බාහිර ලෝකයට පවතින ප්‍රවේශය සීමා විය.
- එහි ප්‍රතිඵලයක් වශයෙන්, සියළු දෙනා නිවෙස්වලට කොටු වී සිටින විට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ නිරත වූ අපරාධකරුවන්ට තම වින්දිතයන් දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රචණ්ඩත්වයට ලක් කිරීමට වැඩි අවස්ථාවක් ලැබුණි.
- තවද, ගෘහස්ථ හිංසනය පිළිබඳ සිද්ධීන් වාර්තා කිරීමට හෝ තම නිවසේ සිටම පැමිණිලි කිරීමට කාන්තාවන්ට ස්වාධීන සන්නිවේදන ක්‍රම සඳහා ප්‍රවේශය නොතිබුණි.
- බොහෝ කාන්තාවන්ට සේවා සපයන්නන් ඇමතීමට 'ආරක්ෂිත දුරකථනයක්' සඳහා ප්‍රවේශය නොතිබූ අතර ඔවුන්ට ඒ සඳහා අපයෝජකයාගේම දුරකථනය භාවිතා කිරීමට සිදු විය. මෙය තවදුරටත් ප්‍රචණ්ඩත්වයේ අවදානම වැඩි කළේය.
- සේවා සපයන්නන් වෙත ප්‍රවේශ වීමට සමත් වූ වින්දිතයන් ද පවසා ඇත්තේ ඔවුන්ට ලැබුණු සේවාව ගුණාත්මකභාවය අතින් පහල මට්ටමක පැවති බවයි.



### 3. ධාරිතාව නොමැතිකම

- කොවිඩ් 19 වෛරසයේ ක්ෂණික තර්ජනය සහ මෙම අංශ කෙරෙහි එහි බලපෑම ආමන්ත්‍රණය කිරීම සඳහා විවිධ අංශවල පිරිස් තම සම්පත් යොමු කිරීම නිසා, ගෘහස්ථ හිංසනයට විසඳුම් සෙවීමේදී විවිධ පාර්ශ්වකරුවන් අතර පැවති සම්බන්ධීකරණයේ සහ හැකියාවේ ඌනතාවය වසංගත තත්වය තුළ තවදුරටත් අවම විය.
- අර්බුදය හමුවේ නිසි ලෙස කටයුතු කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපෙල සේවකයන්ට ලබාදී ඇති පුහුණුව ප්‍රමාණවත් නොවීම/පුහුණුවක් නොමැතිකම නිසා කාන්තාවන් ඇතුළු අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ලැබුණු සේවාව සීමිත විය.



### 4. ශ්‍රී ලංකාව තුල පවතින ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිශ්චිත දත්ත නොමැතිකම

- ගෘහස්ථ හිංසනය නිරීක්ෂණය කිරීම භාර දෙපාර්තමේන්තුගත ආයතන දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් වාර්තා වූ සිද්ධීන් පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වා ගෙන නොමැත.
- මීට අමතරව, වසංගතයට පෙර සහ පසු ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම්වල සංසන්දනාත්මක වැඩිවීමක් පිළිබිඹු කරන නිශ්චිත දත්ත නොමැතිකම,ජාතික සමීක්ෂණ නොමැතිකම සහ දුර්වල ලෙස නඩත්තු කරන ලද පොලිස් වාර්තා සහ රෝහල් වාර්තා සමඟ සම්බන්ධ කල හැක.



**5. සමස්ත යටිතල පහසුකම් කොවිඩ් 19 හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුනු බලපෑම සමඟ කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවීම**

- පවතින පද්ධති සහ ආයතන හරහා ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය වී ඇති අතර, පවතින සංස්කෘතික සහ සමාජීය සම්මතයන් හේතුවෙන් හිංසනය පිළිබඳ පැමිණිලි කිරීම ගර්හාවට ලක්වන කාරණයක් යැයි මතයක් පවතී. එබැවින්, පද්ධතිය සමස්තයක් ලෙස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු වලට සංවේදී නොවේ.
- මෙම සමස්ත තත්ත්වයන් පහත සඳහන් ක්ෂේත්‍රවල නිරීක්ෂණය වූ දරුණු ඌනතාවයන්ට හේතු විය හැක:
  - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු ඉහළ මට්ටමින් හඳුනා ගැනීම්
  - සේවා සැපයීම අනුව අන්තර් ආංශික සම්බන්ධීකරණය.
  - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදිතාවය සම්බන්ධයෙන් පුහුණුව ලද සහ සෑම මට්ටමකින්ම ධාරිතාවය සහිත කාර්ය මණ්ඩලය.
  - තීරණ ගන්නා ආයතන තුල කාන්තා නියෝජනය.
  - ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ ආයතනයක්.

## 1.3 ආංශික දුර්වලතා:

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ එයින් ආරක්ෂා වීම සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ අංශ පවතී. මෙම කොටසින් එසේ හඳුනාගත් එක් එක් ක්ෂේත්‍රය තුළ පවතින අඩුපාඩු පෙන්වා දෙයි.



**1. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව සහ කාන්තා කාර්යාංශය, කාන්තා කටයුතු පිළිබඳ ජාතික යාන්ත්‍රණයේ ක්‍රියාකාරී හස්තයන් වේ.

- මෙම හස්තයන් සතුව පාලනය සහ අරමුදල් නොමැතිකම හේතුවෙන්, පද්ධතියේ සමස්ත කාර්යක්ෂමතාවය (ක්ෂණික ඇමතුම් ඇතුළුව) තක්සේරු කළ නොහැක.
- ජාතික කමිටුව සතු අනෙකුත් දුර්වලතා ලෙස,
  - ප්‍රතිපත්ති නිකුත් කිරීමේ අධිකාරියක්;
  - නීතිමය සහ තීරණ ගැනීමේ හැකියාවක්;
  - වින්දිතයන්ට හදිසි සේවා සැපයීම සඳහා අරමුදල් සහ සම්පත් උදා: නවාතැන් පහසුකම්; නොමැතිකම යනාදිය පෙන්වා දිය හැකිය.



**2. යුක්තිය පිළිබඳ අංශය**

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතෙහි "ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය" පිළිබඳ පටු නිර්වචනයක් අඩංගු වන අතර එය මෙම පනතෙන් ප්‍රතිලාභ ලබා ගත හැකි වින්දිතයින් කණ්ඩායම් කිහිපයක් බැහැර කරයි.



- නිදසුනක් වශයෙන්, අද දක්වා විවාහ බන්ධනය තුල දූෂණය අපරාධයක් බවට පත් කර නොමැති අතර එම නිසා එම හිංසනයට ගොදුරු වූවන් ආරක්ෂාවෙන් බැහැර කරනු ලැබේ.
- ආරක්ෂක නියෝගවලට අනුකූල වීම සහ ඒවා බලාත්මක කිරීම සහතික කිරීම සඳහා අධීක්ෂණ පද්ධතියක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනත තුල අඩංගු නොවේ.
- තවද, අතුරු ආරක්ෂණ නියෝග ලබාගැනීමේ සැලකිය යුතු ප්‍රමාදයක් පවතී.
- වසංගතය අතරතුර උසාවි වසා දැමීමේ ප්‍රතිඵලයක් ලෙස නීතිමය ක්‍රියාදාමයන් ද නතර වී අධිකරණ පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයට ඇතිවූ මෙම බාධාවන් ගෘහස්ත ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සාධාරණ කාල රාමුවක් තුළ වින්දිතයින්ට සහන ලබා ගැනීමට ඇති හැකියාව කෙරෙහි බලපාන ලදි.
- එපමණක් නොව, විනිසුරුවරුන්, නීතිඥයින් සහ අධිකරණ කාර්ය මණ්ඩලය ඇතුළු අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරීන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අදාල නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සංවේදීභාවයෙන් තොරව කටයුතු කිරීම වින්දිතයාට දිගින් දිගටම අවාසිදායක වේ.



### 3. බලාත්මක කිරීමේ අංශය

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් පළමුවෙන්ම සම්බන්ධ වන ස්ථානය ලෙස බොහෝ විට පොලිස් නිලධාරීන් ක්‍රියා කරයි. කෙසේ වෙතත්, මෙම පොලිස් ඒකක බොහොමයක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ ගැටළු විසඳීමේ දී සංවේදීභාවයෙන් තොරව ක්‍රියාකරන අතර පැමිණිලිවලට ඔවුන් දක්වන ප්‍රතිචාරය බොහෝ විට වින්දිතයින් තවදුරටත් අපහසුතාවයට පත් කරයි.
- නිදසුනක් වශයෙන්, පොලිස් නිලධාරීන් බොහෝ විට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිලි වැරදි ලෙස හසුරුවා ඇති අතර ආරවුල් බේරුම්කරගැනීමට වින්දිතයින්ට බල කරයි.
- තවද, වසංගතය අතරතුර පනවන ලද දැඩි අගුලු දැමීමේ රෙගුලාසි හේතුවෙන්, කාන්තාවන්ට පොලිස් ස්ථාන වෙත ප්‍රවේශය නොතිබූ අතර සහාය ඉල්ලා ඔවුන් විසින් ලබාදුන් ඇමතුම්වලට ද බොහෝ විට පිළිතුරු නොලැබුණි.
- විශේෂයෙන් වසංගතය අතරතුර, පද්ධතියේ සමස්ත අකාර්යක්ෂමතාවයට හේතුවූ මූලික කාරණා වශයෙන් පහත සඳහන් ගැටළු හඳුනාගෙන ඇත:
  - පොලිස් සහ කාන්තා හා ළමා ආධාර කවුළු ක්‍රියාත්මක නොවූ අතර ඒවා සඳහා ප්‍රමාණවත් සම්පත් සපයා නොතිබුණි. තවද, විපතට පත් වූවන්ට ක්ෂණික ඇමතුම්/දුරකථන අංකවලට සම්බන්ධ වීමට නොහැකි විය.
  - බලාත්මක කිරීමේ ඒකක සතු ධාරිතාව, කාර්යක්ෂමතාව, කැපවීම සහ කාන්තා නියෝජනයේ අඩුවක් තිබුණි.



## 4. සෞඛ්‍ය අංශය

- ගෘහස්ථ හිංසනයට ගොදුරු වූවන් පළමුවෙන්ම සම්බන්ධ වන ස්ථානය ලෙස සෞඛ්‍ය අංශයේ පිරිස් ද ක්‍රියා කරයි. කෙසේ වෙතත්, සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රය තුලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීභාවයේ අඩුවක් දක්නට ලැබේ.
- නිදසුනක් වශයෙන් විශේෂයෙන් රෝගීන් සමඟ ගනුදෙනු කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල විභව ලක්ෂණ/ රටා හඳුනා ගැනීමට කාර්ය මණ්ඩලය පුහුණු කර නොමැති අතර එම නිසා වින්දිතයින්ට අවශ්‍ය සහාය ලබා දීමට ඔවුන් අපොහොසත් වේ.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට තම අත්දැකීම් බෙදා ගැනීම සඳහා රජයේ රෝහල්වල පිහිටුවා ඇති ආරක්ෂිත අවකාශයක් වන මිතුරු පියසට ක්ෂණික දුරකථන අංකයක් නොමැත. එබැවින්, අපයෝජන සිද්ධීන් වාර්තා කිරීම සඳහා වින්දිතයින් රෝහල් වෙත පැමිණිය යුතුය.
- මීට අමතරව, මිතුරු පියස රෝහල් තුළ වෙන්වූ දුරස්ථ ස්ථානයක පිහිටා නොමැත. එබැවින් වින්දිතයින් හට අවශ්‍ය වන පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය නොමැතිකම උපකාර පැතීම සඳහා ඔවුන් ගන්නා තීරණයට බලපෑම් කරයි.



# 2 නිර්දේශ

## 2.1 දිගු කාලීන ප්‍රතිසංස්කරණ



### 1. කාන්තාවන් සඳහා ජාතික යාන්ත්‍රණයක්

- කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ස්වාධීන කැබිනට් අමාත්‍යාංශයක් බවට උසස් කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන ජාතික අයවැය රාමුවක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.



### 2. කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුවට (NCW) නෛතික බලතල ලබා දීම

- කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව වෙත නෛතික බලතල ලබා දී දෙපාර්තමේන්තු වල සියලුම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඒකක සඳහා මූලික කේන්ද්‍රස්ථානයක් වශයෙන් කටයුතු කිරීමට එහි බලතල පුළුල් කිරීම.
- කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව යටතේ පර්යේෂණ ඒකකයක් සහ අධීක්ෂණ සහ සම්බන්ධීකරණ ඒකකයක් - වශයෙන් උප ඒකක 2ක් පිහිටුවීමට කටයුතු කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනය, දත්ත රැස් කිරීම සහ පර්යේෂණ, පද්ධති සමාලෝචනය සහ අන්තර් දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය ඇතුළු කාර්යයන් භාර ගැනීමට හැකි වන පරිදි කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුවෙහි වගකීම් පුළුල් කිරීම.
- වින්දිතයින්ට සුහසාධන චෙක්පත් සහ මනෝ සමාජීය සහය, ආර්ථික සවිබල ගැන්වීම සඳහා අවස්ථා සහ එහි නීතිමය වරම හරහා නීති ආධාර ලබා ගැනීමේ මාර්ග ඇතුළු පහසුකම් සැපයීම.



### 3. පණිවිඩ යැවීම, ධාරිතා වර්ධනය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී පුහුණු සහ තනතුරු තුල කාන්තා නියෝජනය වැඩි කිරීම

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශ ප්‍රතිසංස්කරණය කිරීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ සහය ලබා ගැනීම සඳහා ඇති විකල්ප පිළිබඳව වින්දිතයින් දැනුවත් කිරීම සඳහා ප්‍රජා මට්ටමේ සේවකයින් සහ බිම් මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමඟ සම්බන්ධ වීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් ශ්‍රම බලකාය තුල සංවේදීභාවය වර්ධනය කිරීම.
- පාසල්, විද්‍යාල සහ ප්‍රජා මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ධනාත්මක පණිවිඩ යැවීම ක්‍රියාත්මක කිරීම.
- විවිධ අංශවල/ආයතනවල ශ්‍රම බලකාය තුලට වැඩි කාන්තා ප්‍රතිශතයක් බඳවා ගැනීම.



### 4. 2005- හිංසනය වැලැක්වීමේ පනත ප්‍රතිසංස්කරණය කිරීම

- ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතට යෝග්‍ය සංශෝධන සම්මත කිරීම සඳහා සහාය ලබාදීම.
- දණ්ඩ නීති සංග්‍රහයේ ලැයිස්තුගත කර ඇති වැරදි සමඟ සම්බන්ධ කිරීමෙන්/ඒවාට සීමා කිරීමෙන් තොරව ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතේ ගෘහස්ථ හිංසනය පිළිබඳ අර්ථ දැක්වීම පුළුල් කිරීම.
- පහත සඳහන් දෑ ඇතුළත් කල හැකි පරිදි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතේ ආකෘතිය වෙනස් කිරීම:
  - වින්දිතයන් වෙත ඇති රාජ්‍ය වගකීම් ඇතුළත් කිරීම සහ ඒවා පැහැදිලිව ප්‍රකාශ කිරීම;
  - වින්දිතයා වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට රජයට බලය ලබා දීම (අනෙකුත් අධිකරණ බලයන්ට සමාන);
  - වින්දිතයන් වෙනුවෙන් නඩු කටයුතු ආරම්භ කිරීමට නියෝජිතයින්ට අවසර දීම;
  - ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව නඩු විභාග කිරීම සඳහා වේගවත් ක්‍රියා පටිපාටි පද්ධතියක් හඳුන්වා දීම;
  - අතුරු නියෝග සඳහා ඉල්ලුම් කළ යුතු සහ නිකුත් කළ යුතු පැහැදිලි කාල රාමු සකස් කිරීම;
  - පනත යටතේ නිකුත් කරන ලද සියලුම ආකාරයේ අධිකරණ නියෝග නිරීක්ෂණය කිරීමට බල කරන විධිවිධාන ඇතුළත් කිරීම; හා
  - අධිකරණය විසින් නිකුත් කරන ලද ආරක්ෂණ නියෝග සහ පරිපූරක නියෝග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම පාලනය කිරීම සහ සමාලෝචනය කිරීම සඳහා ස්වාධීන ආයතනයක් පිහිටුවීම සඳහා කටයුතු කිරීම.



### 5. පර්යේෂණ සහ වාර්තා තබා ගැනීම

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ලා උපකාර වූ/අසාර්ථක වූ ගෘහස්ථ හිංසනයේ ප්‍රවණතා සහ උපාය මාර්ග හඳුනා ගැනීමට ක්‍රමානුකූල පර්යේෂණ පැවැත්වීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් ඇතුලත් සාක්ෂි පදනම් කරගත් දත්ත පද්ධතියක් සැකසීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ප්‍රවණතා සහ ක්‍රියාත්මක වූ හෝ අසාර්ථක වූ උපාය මාර්ග පිළිබඳ ආනුභවික දත්ත උපුටා ගැනීම සඳහා ජාතික මට්ටමේ සමීක්ෂණ පැවැත්වීම.
- සෑම දිස්ත්‍රික්කයකම, පළාතකම සහ ජාතික මට්ටමින් වාර්තාවන ගෘහස්ත ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන්, උපකාරක ඇමතුම් සේවා හරහා ලැබෙන ආපදා සම්බන්ධ තොරතුරු සහ කාලයත් සමඟ මේ සම්බන්දයෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ද ඇතුළත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.

## 2.2 කෙටි කාලීන ප්‍රතිසංස්කරණ



### 1. කාන්තා අමාත්‍යංශය

කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව විසින් පහත සඳහන් කාර්යයන්/වගකීම් ඉටු කිරීමට පියවර ගත යුතුය:

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් / ඇමතුම් ලබා ගැනීම සඳහා පුහුණු ක්‍රියාකරුවන් සහ ත්‍රෛභාෂා සේවා සමග පැය 24 පුරා ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් අංකය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- දත්ත වාර්තා කර ගැනීම සහ පද්ධතියේ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා වරින් වර සමාලෝචන සිදු කිරීම.
- එක්රැස් කරන ලද දත්ත සහ වරින් වර සමාලෝචනවලින් සොයා ගන්නා ලද තොරතුරු මත පදනම්ව පද්ධතියේ අඩුපාඩු/හිඩැස් හඳුනාගෙන ඒවා විසඳීමට කටයුතු කිරීම.
- වින්දිතයින්ට උපකාර කිරීම සඳහා වෙනත් ප්‍රතිපත්ති මට්ටමේ මැදිහත්වීම් කිරීම.
- භාවිතයට නොගත් ගොඩනැගිලි ආදියෙහි තාවකාලික ආරක්ෂිත නිවාස නිර්මාණය කිරීම සඳහා සම්පත් යෙදවීම.



### 2. යුක්තිය පිළිබඳ අංශය

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාළ කරුණු විභාග කිරීම සඳහා වෙනම අධිකරණයක් පිහිටුවීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් හදිසි කාරණා ලෙස වර්ගීකරණය කිරීම සහ ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා උසාවි වෙනත් ආකාරයකින් වසා ඇති අවස්ථාවන්හිදී ඩිජිටල් ක්‍රමවේද ඔස්සේ අතථ්‍ය නඩු විභාගයන් සිදු කිරීමට ඉඩ ලබාදීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධිකරණ ක්ෂේත්‍රයේ විනිසුරුවරුන්, නීතිඥයින් සහ අනෙකුත් පුද්ගලයින් සංවේදී කිරීම සඳහා පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන් හි බරපතලකම හඳුනා ගැනීම සහ ආරක්ෂණ නියෝග කඩිනමින් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නඩු විසඳීම සඳහා කඩිනම් ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම.





### 3. බලාත්මක කිරීමේ අංශය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාළ කාරණා සම්බන්ධයෙන් පොලිස් බලකාය දැනුවත් කිරීම.
- පොලිස් බලකායට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහ මනෝ සමාජීය පුහුණුව ලබා දීම.
- මෙම අංශයේ ශ්‍රම බලකාය තුළ ධාරිතාව සහ කාන්තා නියෝජනය වැඩි කිරීම.
- පැමිණිලි කිරීමෙන් පශ්චාත් කාලය තුල පසු විපරම් සහ නිවෙස් නිරීක්ෂණ කටයුතු සහතික කිරීම.
- වින්දිතයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම.
- ලැබුණු ඇමතුම් පිළිබඳ වරින් වර වාර්තා ඉදිරිපත් කිරීම සහ වාර්තා වී ඇති ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිද්ධීන්වල අතපසු වූ කටයුතු කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව හි පර්යේෂණ ඒකකයට යවන බවට සහතික වීම.
- ත්‍රෛභාෂා සේවා සපයන ක්ෂණික දුරකථන ඇමතුම් සේවා ක්‍රියාත්මක කිරීම සහ ආපදා ඇමතුම් පිළිබඳ පසු විපරම් කිරීම.
- පැය 24 පුරා ක්‍රියාත්මක කාන්තා සහ ළමා උපකාර කවුළු වල ක්‍රියාකාරිත්වය සහතික කිරීම.




### 4. සෞඛ්‍ය අංශය

- සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සංවේදී කිරීම සහ මෙම අංශය තුළ ශ්‍රම බලකායේ ධාරිතාව වැඩි කිරීම.
- වින්දිතයන් සඳහා පෞද්ගලිකත්වය සහතික කිරීම සඳහා මිතුරු පියස මධ්‍යස්ථාන රෝහල්වල වෙන්වූ දුරස්ථ ස්ථානවල ස්ථානගත කිරීම.
- මිතුරු පියස අනෙකුත් අංශ සහ කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව හි අධීක්ෂණ සහ සම්බන්ධීකරණ ඒකකය සමඟ සමීපව සම්බන්ධ වන බවට සහතික වීම.
- වින්දිතයින්ට භෞතිකව රෝහලට ප්‍රවේශ වීමකින් තොරව දුරස්ථව ආධාර ලබා ගැනීමට හැකි පරිදි මිතුරු පියස සඳහා ක්ෂණික ඇමතුම් සේවාවක් ක්‍රියාත්මක කිරීම.



## 5. සේවා සපයන්නන් වෙත ප්‍රවේශය වැඩි කිරීම

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි හිංසනය සම්බන්ධයෙන් වන සේවා සපයන්නන් සඳහා අගුලු දැමීමේ සීමාවන් ලිහිල් කිරීම.
- පවතින යටිතල පහසුකම් සහ යාන්ත්‍රණයන් තුළ ආයෝජනය කිරීම සහ වින්දිතයින් සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කරන අත්‍යාවශ්‍ය නාලිකා වැඩි වශයෙන් නිර්මාණය කිරීම් උදාහරණයක් ලෙස ක්ෂණික ඇමතුම් සේවා ස්ථාපිත කිරීම.
- යොමු කිරීමේ ක්‍රමය ප්‍රතිසංස්කරණය කර, වින්දිතයින්ට ඕනෑම වේලාවක සහය ලබා ගැනීමට හැකි වන පරිදි සේවා සපයන්නන් ලැයිස්තුවක්/වැඩ මුර ක්‍රමයක් යටතේ සිටින බව සහතික කිරීම.
- නිලධාරීන් සහ පළමු සම්බන්ධතා ස්ථාන සඳහා පුළුල් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ලබාදීම.
- පළමු සම්බන්ධතා ඇති සෑම ස්ථානයකම ක්ෂණික ඇමතුම් සේවා ක්‍රියාත්මක කිරීම.
- උපකාර සඳහා වන දේශීය ගෘහස්ථ හිංසන සංඥාවක් නිර්මාණය කිරීම සහ සමාජ මාධ්‍ය, අත් පත්‍රිකා, රූපවාහිනී වෙළඳ දැන්වීම් ආදිය හරහා එය ප්‍රචලිත කිරීම.



**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**

16/1, මොරිස් පෙදෙස, කොළඹ 05, ශ්‍රී ලංකාව

+94 11 2055404

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

/Centre-for-Equality-and-Justice

/CEJ_SriLanka

/cej_srilanka

/channel/CEJ Sri Lanka